

සව් සත වෙත මෙත පා සෙතසැදූ
ගව්තම බුදු ගුණයෙන් නෙතපැදූ
සව් වකු ලෙස සසුනෙහි රැස්වීදූ
සිව් සස් දැන - පවසනු මැනසාදූ!
- රුවන්

## සැම සුවඳට වඩා සිල් සුවඳ උතුම්

– නාරම්පනාවේ ආනන්ද හිමි

බුදු දහමෙහි සඳහන් සීල ප්‍රතිපදාවට අවතීර්ණ වීම තුළින් පුද්ගලයාට ලද හැකි ජීවිත සාර්ථකත්වය, නවම් පුර අටවක පෝද ධර්ම දේශනාවෙන්. සිල්වතාගේ ගුණ සුවඳ – ලොව අන් සියලු සුවඳ පරදවා – සැම දෙස විහිදෙන බව පැවසූ බුද්ධ දේශනාවකට අර්ථකථනයක්.

## ඔබ බුදු දහම පිළිගන්නේ ඇයි?

– කඳුබොඩ ධම්මරක්ඛිත හිමි

බුදු දහම තුළින් පුද්ගලයකුට ලද හැකි ජීවිත අවබෝධය සහ ලෝක ආගම් අතර බුදු දහමෙහි සුවිශේෂත්වය. විවිධ ජීවිත අරමුණු වෙනුවෙන් ආගම් අදහන අයට බුදු දහම පිළිපැදීමේ පරමාර්ථ හඳුන්වාදීමට ලේඛකයා උත්සාහ කරයි.

## දෙසන උතුම් බණ දෙසමු සොඳින් සැම

– කොත්මලේ අමරවංශ නාහිමි

ධර්ම දේශනා කරන ගිහි – පැවිදි උගතුන්ට මග පෙන්වීමක් සිදු කිරීමට දරන ලද උත්සාහයකි. බුදු දහමේ විශිෂ්ටත්වය සහ ඊට සරිලන දේශනා පිළිවෙත කුමක් විය යුතුද යන්න විග්‍රහ කිරීමට ලේඛකයා උත්සහා දරා ඇත.

## මග – ඵල ලැබීම සිහිනයක් නොවේ – 13

– දෙලොස්වල උදිතධීර හිමි

බෞද්ධ පිළිවෙතෙහි දැක්වෙන උසස් බුද්ධි මට්ටම්වලට පත්වීම – ඇතැම් අය පවසන තරම් දුෂ්කර වූවක් නොවන බවත්, එය මිනිස් බුද්ධියෙන් පවත්නා ජීවිත කාලය තුළදීම – උත්සාහයෙන් සිදු කළ හැකි දෙයක් බවත් පැවසෙන ලිපි පෙළක දහතුන් වැනි ලිපිය.

## සැදැහැ මහිම

– පලල්ලේ සරණජෝති හිමි

‘ශ්‍රද්ධාව’ නමැති ගුණාංගයට – බෞද්ධ පිළිවෙත තුළ හිමි වන ප්‍රමුඛස්ථානය. බුදු දහමේ දැක්වෙන ‘ශ්‍රද්ධාව’ සහ වෙනත් ආගම්වල දැක්වෙන ‘භක්තිය’ අතර වෙනස.

## කවි ඇසින් දුටු සිරි පද වරුණ

– සිරිපාල මාදුවගේ

බුදුරජාණන් වහන්සේ සමන්තකූට පර්වතය හෙවත් සමනළ කඳු මුදුන මත සිරි පා සටහන් තැබීම ගැන ඓතිහාසික ශාසනික සිද්ධිය පිළිබඳ සහ එද මෙද තුර සිරිපා වන්දනාව ගැන සිරි ලක ජන කවියා – තමන්ගේ කවි ඇසින් දුටු අයුරු – පිළිබඳ ඓතිහාසික කාව්‍ය ග්‍රන්ථ ඇසුරෙන් සිදු කැරෙන විමසුමකි.

## සොබා දම් මහිමයෙන් පිබිදුණු බොදු සිතක ප්‍රභාව

– හාතියල්වල චන්දානන්ද හිමි

බුදුරදුන් හා උන්වහන්සේ ගත් මග ගමන් කරන ශ්‍රාවකයන් තුළ දක්නට ලැබෙන පරිසර හිතකාමී පිළිවෙත් සමූහය. පුද්ගල ප්‍රඥා වර්ධනයට සොබා දම් පහසෙන් ලැබෙන අනුබලය.

## මථුරා

– සිරිසමන් විජේතුංග

ඉන්දියාවේ මථුරා හි බෞද්ධ කලා නිර්මාණ පිළිබඳ විමර්ශනාත්මක, පුරාවිද්‍යා තොරතුරු ඇතුළත් ලිපියකි.

## රෑනගල රජමහ විහාරය

– දර්ශි කලුබෝවිල

‘සිත නිවෙන තැන්’ විශේෂාංගය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිසංසල පරිසරයක පිහිටි පැරණි – ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු. අලව්ව ප්‍රදේශයේ සිට පොල්ගහවෙල දක්වා ඇති මාර්ගයේ අතුරු මගකින් හැරී යන විට මෙම විහාරස්ථානය හමුවේ.

## ගාල්ලේ දහම් සෙවණ විහාරය

– ජයන්ත කල්‍යානන්ද

‘වෙහෙර විහාර’ විශේෂාංගය යටතේ දකුණු පළාතේ ගාල්ල දංගෙදර ප්‍රදේශයේ පිහිටි අභිනව විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.